# රසායනික පොහොර වලින් තොරව පස සාරවත් කර ගත හැකි ද?

*එස්. ආර්. බණ්ඩාර*
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිනි

කාලයක් තිස්සේ වගා කිරීමෙන් පසෙහි ඇති පෝෂණ ගුණය ක්‍රමයෙන් පිරිහී යයි. එබැවින් නිතර පසට පෝෂ්‍ය පදර්ථ එකතු කළ යුතු වේ. වගාවේදී එය තරමක් දුරට ස්වාභාවිකවම සිදු වේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. එබැවින් සත්ව හා ශාබ මූලික පොහොර වර්ග වලට අමතර වශයෙන් පසට පෝෂ්‍ය පදර්ථ ලබා දීම අත්‍යවශ්‍ය වේ.අතීතයේ දී අධි ජනගහණයෙන් තොවූ නිසා පස වගාවල් සඳහා ප්‍රයෝජනයට ගත්තේ යම් ආකාරයක ස්වාභාවික පාලනයකින් යුතුව යි. නමුත් වර්තමානයේ ජනගහණ වර්ධන වේගය ඉතා වේගවත් නිසා කෘෂිකාර්මික, කාර්මික නිෂ්පාදන කටයුතු වේගවත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් පසෙහි මෙන්ම පරිසරයේ සාරවත් බව ද, ක්‍රමයෙන් නිෂ්පාදන කටයුතු වල ග්‍රහණයට ලක් වීමෙන් පරිහානියට පත් වෙමින් තිබේ. මේ නිසා පෙරට වඩා පස සාරවත් කිරීමේ අවශ්‍යතාව දැන් ඉතා වැඩියෙන් දැනෙන්නට වී තිබේ. මේ සඳහා පොහොර භාවිතා කිරීම එද සිටම පැවැති විකල්ප යයි.

පොහොර ගත් විට එය ස්වාභාවික පොහොර හා රසායනික පොහොර වශයෙන් දෙවර්ගයක් වේ. සත්ව හා ශාබ ද්‍රව්‍ය දිරා පත් වී පසට එක්වීමෙන් ස්වාභාවික පොහොර සෑදේ. ඒ හැර නවීන තාක්‍ෂණ දියුණුව නිසා ලද දැණුම උපයෝගී කරගෙන හා රසායනික සංඝටක උපයෝගීකරගෙන නිපදවන කෘත්‍රිම පොහොර වර්ග ද වේ. ඒවා රසායනික පොහොර නමින් හැඳින්වේ. මේ දෙවර්ගයේම පොහොර වලින් පස සාරවත් කිරීම වර්තමානයේ දක්නට ලැබේ. ස්වාභාවික අන්දමින් පසට පෝෂ්‍ය පදර්ථ එක් කරන බැවින් ස්වාභාවික පොහොර පරිසරය සමග ඉතා සමීප වේ. එබැවින් එය හිතකර යි. කෘතිම පොහොර වලින් ජීව ධාතු පසට කෘතිම වශයෙන් එකතු කරයි. ඒ මගින් වගා කරන පැළෑටියේ අධිවර්ධනයක් ඉතා ඉක්මණින් පෙන්වීමට සමත් වුවත් දිගු කාලීනව පසෙහි ජීව රසායනික විපරිනාමයේ වෙනස්කම්ඇති කරන බවට තොරතුරු ලැබී තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ සංවිධාන විසින් රසායනික පොහොර භාවිතයටවඩා ස්වාභාවික පොහොර හා වගා කරන බෝග මාරුව භාවිතයෙන් පස යථා තත්ත්වයට පත් කර ගන්නට හා රසායනික නිෂ්පාදන භාවිතා නොකර වගා කටයුතු කිරීමට ගොවීන් උනන්දු කරවීමට පටන් ගෙන තිබේ. ස්වාභාවික පොහොර වලින් පසෙහි හියුමස් නම් පංගු කොටස් වල ප්‍රවර්ධනය වීමක් ඇති කරවන බවත් මෙය නිරසාර ගුණයෙන් යුක්ත බවත් එමගින් සරු අසවනු ලබා ගත හැකි බවත් මේ පිළිබඳව ස්වයං පර්යේෂණයක නිරත වී ඇති ප්‍රංශයේ "පිලිප්සේ සෙන් බියු" ප්‍රකාශ කර ඇති මත යි. ඔහුගේ එම මතය සනාථ කරමින් "නිෂ්පාදන මූලික ගොවිතැන් ක්‍රමයෙන් හානිකර බලපෑම වසර බොහෝ ගණනක් ගත වන තුරුම දරා ගැනීමට ප්‍රමාණවත් තරමින් බටහිර යුරෝපයේ පස සාරවත් බවත් එහෙත් නිරක්‍ෂයට ආසන්න රටවල එය දරා ගැනීමට තරම් පස ප්‍රබල නොවන බැවින් පස ඉක්මණින් හානියට ලක්වෙන බවත් බවසා තිබේ. ඒ අනුව අප්‍රිකාවේදී විශේෂඥතාවය ලත් ප්‍රංශ කෘෂි විද්‍යාඥයෙකුවන "රෙනේ ඩුමොන්ට්ගේ" පරිසර අවබෝධය පිළිබඳ අධ්‍යයනය සාර්ථක ප්‍රතිඵල ලබා දුන්නේ අහම්බෙන් නොවේ යනු බියුගේ මතයයි.

ජීව තාක්‍ෂණ ගොවිතැන් ක්‍රමය යටතේ හියුමස් නිෂ්පාදනය වැඩි කරන කොම්පෝස්ට් පොහොර මගින් සරු කෙරුණු පස තව දුරටත් රැක ගැනීම සඳහා වසර 7 ක් තිස්සේ වගා කරන බෝග මාරු කෙරේ. මුල්ම වසර දෙක තුන තුළ පස පිරිසිදු කරන අතරම එය සාරවත් කරන තෘණ වර්ග වවනු ලබයි. අනතුරුව දිගුකාලීන ධාන්‍ය වවා ඉන්පසු කෙටිකාලීන වෙනත් ධාන්‍ය වර්ගයක් වගා කෙරේ. මේ වන විට පස සෙමින් සෙමින් තම නයිට්‍රජන් ප්‍රමාණය වර්ධනය කර සාරවත් බව හිමි කර ගනී.

මේ ආකාරයට පස ගොඩ නැංවීමේ දී රසායනික නිෂ්පාදන පසට යෙදීම සම්පූර්ණයෙන්ම ඉවත් කෙරෙන අතර පස හැරීමට, බුරුල් කිරීමට හා සියුම් කිරීමට ගැළපෙන විශේෂ උපකරණ මෙවලම් ඒ සඳහා භාවිතා කෙරේ. ඒවා වියදම් අධික උපකරණ නොවේ.

මීළඟ ප්‍රශ්ණය ජීව තාක්‍ෂණික ගොවිතැන ලාභ දයක ද නැද්ද යන්නයි. මෙහි දී "ලාභය තීරණය කරන සාධක කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. අඩු නිෂ්පාදන පිරියැවකින් වැඩි නිෂ්පානයක් සාධනය කිරීමෙන් ලාභය වැඩිවේ. මෙහි දී ජීව තාක්‍ෂණික ගොවිතැන සඳහා මුලින් ම කාලය නමැති සාධකය ටිකක් වැඩියෙන් කැපකර මුල් අවස්ථාවේදී පස ගොඩ නගා ගත් පසු, එතැන් සිට වගා කටයුතු වැඩි නිෂ්පාදන වියදමක් නැතිව කරගෙන යා හැකියි. එසේ කිරීමේදී නිෂ්පාදන වියදම අඩු නිසා ලැබෙන නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් "ප්‍රතිලාභ" වශයෙන් ව්‍යාපාරය පෝෂණය කරයි. ඉන්දියාවේ මද්‍රාසියේ පිහිටි "ප්‍රංශ කොළණි" යක්වූ "පොන්ඩිචෙරි" (Pondicherry) ද මේ සම්බන්ධයෙන් ඉතා හොඳ උදහරණයකි.

## ගොවි ජනතාව සගරාව කෙරෙහි

**ඔබ දක්වන ප්‍රතිචාරය අප ඉතා අගේ කොට සලකමු. එම යෝජනා හා අදහස් මෙසේ යොමු කරන්න.**

**සංස්කාරක**
ගොවි ජනතාව,
තැ: පෙ: 1522
කොළඹ 7.